ඔබගේ බැංකු ගිණුම
පහසුවෙන් කළමනාකරණය
හොං කොං හි සිටින ව්‍යාපාර හිමිකරුවන්
සඳහා මාර්ගෝපදේශයක්
HSBC
Together we thrive
Issued by The Hongkong and Shanghai Banking Corporation Limited

හැඳින්වීම

ඔබේ ගිණුම නිසි ලෙස කළමනාකරණය කිරීම ඔබේ මෙන්ම පුළුල් ප්‍රජාවගේ මුදල් ද සුරක්ෂිත කරනු ඇත

- අපගේ ව්‍යාපාරික ගනුදෙනුකරුවන් ද බොහෝ විට අප සමග පුද්ගලික ගිණුමක් පවත්වා ගනී. ඔබගේ ව්‍යාපාරික ගිණුම් පුද්ගලික භාවිතය සඳහා නොව ව්‍යාපාරය සඳහා ම පවත්වා ගැනීම තහවුරු කිරීම අපගේ ඉහළම උපදේශයයි
- ව්‍යාපාර හිමිකරුවන් ලෙස, ඔබ දෛනික වැඩ කටයුතු සඳහා කාර්ය බහුල වී වේලාව සමග තරඟයක යෙදෙන අතර, එබැවින් ඔබගේ බැංකු ගිණුම් ස්මාර්ට් ලෙස කළමනාකරණය කරන ආකාරය පිළිබඳ මගපෙන්වීමෙන් ප්‍රතිලාභ ලැබීමට ඉඩ ඇත. ඔබගේ ව්‍යාපාරය පුද්ගලික ගිණුම් වලට ද අදාළ විය හැකි වංචාව සහ මූල්‍ය අපරාධ-ක්‍රියාකාරකම් වලින් ආරක්ෂිතව තබා ගැනීම පිළිබඳව උපදෙස් සපයයි

මෙම මගපෙන්වීමෙන්,
අපි පහත දේ ගැන උපදෙස් සපයමු:

1

ඔබගේ ගිණුම එදිනෙදා
හොඳින්ම කළමනාකරණය
කරන ආකාරය

2

සංවිධානයේ වෙනස්කම් පිළිබඳව
අප දැනුවත් කර තැබීම

3

ඔබගේ ව්යාපාරික චක්රයට
වෙනස්කම් යොදාගැනීමේ දී
සලකා බැලිය යුතු කරුණු

4

ඔබගේ පාරිභෝගික
වාර්තාව යාවත්කාලීනව
තබා නොගතහොත් සිදුවිය
හැකි දේ

5

මූල්යන අපරාධවලට
එරෙහිව අපට එකට එක්
වී වැඩ කළ හැකි ආකාරය

6

අප හා සම්බන්ධ වන
ආකාරය

ඔබගේ ගිණුම එදිනෙදා හොඳින්ම කළමනාකරණය කරන ආකාරය

ගිණුම්වල අරමුණ සහ භාවිතය	ගිණුම් වර්ගය අනුව, නීත්‍යානුකූල අරමුණු සඳහා ඔබගේ ගිණුම භාවිතා කරන්න
	පුද්ගලික ගිණුමක් ඔබගේ පුද්ගලික ගනුදෙනු සඳහා පමණක් මිස ව්‍යාපාරික අරමුණු සඳහා නොවේ, එමෙන්ම ව්‍යාපාරික ගිණුමක් ව්‍යාපාරික අරමුණු සඳහා පමණක් මිස පුද්ගලික ගනුදෙනු සඳහා නොවේ
ප්‍රකාශන, ලේඛන සහ වාර්තා	ඔබගේ බැංකු ගිණුම් නිතිපතා පරීක්ෂා කර ඔබගේ බැංකු ප්‍රකාශන සමග සියලුක්‍රියාකාරකම් සසඳන්න
	ඔබ ආදායම්, හුවමාරු හා වියදම් වාර්තා මෙන්ම රිසිට්පත්, ඉන්වොයිස් සහ සහයක ලේඛන තබා ගන්නා බව තහවුරු කරගන්න
	අපේක්ෂිත ලෙස මුදල් හුවමාරු කිරීම, ලැබීම සහ වියදම් කිරීම සිදු කර ඇති බවට පෙන්වීමට දේශීය සහ අන්තර්ජාතික ගෙවීම්වල ප්‍රමාණවත් විස්තර තිබෙන බවට තහවුරු කරගන්න
	ගෙවීම් ගැන වඩා පහසුවෙන් සෙවිල්ලෙන් සිටීමට සහ මුදල් තිබූ තැන සහ ගිය තැන හඳුනාගැනීමට ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් හුවමාරුව සහ ඉලෙක්ට්‍රොනික බැංකු ගනුදෙනු වැනි ඉලෙක්ට්‍රොනික ගෙවීම් නාලිකා හොඳින් ප්‍රයෝජනයට ගන්න
	ඔබගේ බදු බැඳියා වටහාගෙන ඒවාට අනුකූල වන්න. අපට ඔබගේ බදු නේවාසික තොරතුරු සපයා බදු ලේඛනවල පැහැදිලි වාර්තාවක් පවත්වා ගන්න

'සියල්ලට ගැළපෙන එක' මාර්ගයක් නැත, නමුත් සමහර පුරුදු සහ ක්‍රියාමාර්ග වලට ඔබට ඔබගේ ගිණුම ඵලදායීව කළමනාකරණය කිරීමට සහ වංචාවට එරෙහිව ඔබව ආරක්ෂා කිරීමට උපකාර කළ හැකිය.

ආරක්ෂාව සහ කාර්ය මණ්ඩලයේ දැනුවත්භාවය

- ගෙවීම් සඳහා ස්තරගත බලය දීමේ සහ අත්සන් මට්ටම් භාවිතා කරන්න - උදාහරණයක් ලෙස, ඔබගේ ව්‍යාපාරික අන්තර්ජාල බැංකුකරණයේ දී බලය දීමේ ආකෘතියක් සකස් කර වෙනස් අත්සන් කාණ්ඩ සඳහා අනුයුක්ත ගනුදෙනු සීමා සමග අත්සන් කිරීමේ උපදෙස් පිළියෙල කරන්න
- ගෙවීම් සිදු කිරීමට අන් අයට උපකාර කිරීම හෝ ඔබගේ ව්‍යාපාරයට අයත් නොවන වත්කම් හැසිරවීමෙන් වළකින්න
- ඔබ විකුණන්නේ කාටද යන්නත් මිලදී ගන්නේ කාගෙන්ද යන්නත් දැනගන්න - උදාහරණ ලෙස, ආදායකයාගේ සහ ගෙවන්නාගේ තොරතුරු
- ඔබගේ ගිණුම පාලනය කිරීමට අන් අයට බලය දී නොමැති නම් එසේ කිරීමට ඔවුන්ට ඉඩ නොදෙන්න
- ඔබගේ පෞද්ගලික විස්තර, ගිණුම් තොරතුරු, ආරක්ෂණ උපාංගය, අන්තර්ජාල බැංකු හැඳුනුම සහ මුරපදය, ATM කාඩ්පත/ණයවර කාඩ්පත, කාඩ්පත් සත්‍යාපන අගය හෝ චෙක් පොත් අන් අය සමග බෙදාහදා ගැනීමෙන් වළකින්න
- බැංකුවේ නාමයෙන් සිදු කරන බවට කියාපාන දුරකථන වංචා සහ/හෝ තතුබෑම් විද්‍යුත් තැපැල් වලට එරෙහිව සුපරීක්ෂාකාරී වන්න
- ප්‍රරති-වයිරස මෘදුකාංගයක්, ආරක්ෂිත ජාල සම්බන්ධතාවයක් සහ ගිනිපවුරු ආරක්ෂාවක් භාවිතා කරමින් ඔබගේ පරිගණක ආරක්ෂාව යාවත්කාලීන බව තහවුරු කරගන්න
- වංචාව සහ මූල්‍ය අපරාධ අවදානම පිළිබඳව ඔබගේ කාර්ය මණ්ඩලය දැනුවත් කරන්න. නිදසුනක් වශයෙන් අනෙක් පාර්ශ්වයේ විද්‍යුත් තැපෑල තහවුරු කිරීමේ සහ ගෙවීමක් සිදු කිරීමට පෙර දුරකථනයෙන් තහවුරු කරගැනීමේ වැදගත් කම අවධාරණය කරන්න

සංවිධානයේ වෙනස්කම් පිළිබඳව අප දැනුවත් කර තැබීම

වංචාව සහ මූල්‍ය අපරාධවලට එරෙහිවීමේ අපගේ කැපවීමේ කොටසක් ලෙස අප ඔබ හා ඔබේ ව්‍යාපාරය පිළිබඳව නිවැරදි දත්ත තබා ගන්නා බව තහවුරු කරගැනීමට අපට උවමනා වේ. ඔබගේ සමාගමේ සබඳතා තොරතුරුවලට යම් වෙනස් කිරීමක් (උදාහරණ ලෙස, ලිපිනය, දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය වෙනස් කිරීම) සිදු කිරීම පිළිබඳව අපට දැනුම් දීමට අමතරව, ඔබගේ ව්‍යාපාරික චක්‍රයේ වෙනස්කම් පිළිබඳව ඔබ විසින් අපව ක්‍රමානුකූලව දැනුවත් කිරීම වැදගත් වේ.

ඔබගේ ගිණුම් තොරතුරු යාවත්කාලීන කරන ආකාරය පිළිබඳ උපදෙස් සඳහා කරුණාකර 'අප හා සම්බන්ධ වන ආකාරය' කොටස බලන්න.

ඔබේ ව්‍යාපාර චක්‍රයට වෙනස්කම්			ඔබගේ සමාගමේ ව්‍යුහයට සිදු කෙරෙන වෙනස්කම්	
විකුණුම් පිරිවැටුමේ ස්වභාවික ඉහළ යාම	නව වෙළඳපොල සහ පාරිභෝගික කාණ්ඩ වෙත පුළුල් කිරීම	ව්‍යාපාරයේ ස්වභාවයේ වෙනස්කම්	පුද්ගලයන් - අධ්‍යක්ෂකවරු, බලයලත් අත්සන්කරුවන්, කොටස් හිමියන් සහ අවසන් ප්‍රතිලාභී හිමිකරුවන්	නීත්‍යානුකූල ආයතනයක් - උදාහරණ ලෙස, තනි හිමිකරුවකුගේ සිට සීමිත සමාගමක් දක්වා

ඔබගේ ව්‍යාපාරික චක්‍රයට වෙනස්කම් යොදාගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු

ඔබේ ව්‍යාපාර චක්‍රය වෙනස් වන විට, ඔබ වංචාව හෝ වෙනත් මූල්‍ය අපරාධවලට අනාවරණය වීමෙන් වැළැක්වීමට කරුණාකර පහත කරුණු සලකා බලන්න.

අදාළ අවසර හඳුනාගැනීමට උපකාර කිරීමට ඉලක්කගත වෙළඳපොළවල් සහ දේශීය බැංකුකරණය වෙත වෙළඳපොළ සමීක්ෂණ සිදු කරන්න

ඔබ ව්‍යාපාරයක් ලෙස ගනුදෙනු කරන්නේ කවුරුන් සමග ද යන්න - එනම් ඔබගේ මිලදීගන්නන්, සැපයුම්කරුවන්, සේවාදායකයන් සහ සේවා සැපයුම්කරුවන් - සහ ඔවුන්ගේ ව්‍යාපාරික රට සහ දේශසීමා වපසරිය දැනගන්න

ඔබගේ අරමුදල් මූලාශ්‍ර පිළිබඳව දැනුවත්ව සිටින්න - උදාහරණ ලෙස, නව ආයෝජකයන්ගේ හෝ හවුල්කරුවන්ගේ අරමුදල් නීත්‍යානුකූල බව තහවුරු කරගන්න

ගෙවීම් නියෝජිතයන් සහ වේදිකා භාවිතා කිරීම ඇතුළුව ඔබගේ ගෙවීම් ක්‍රම පිළිබඳව සෙවිල්ලෙන් පසුවන්න. බලපත්‍ර නොලත් මුදල් යැවීමේ නියෝජිතයන් මගින් මුදල් හුවමාරු නොකරන්න

ඔබගේ පාරිභෝගික වාර්තාව යාවත්කාලීනව තබා නොගතහොත් සිදුවිය හැකි දේ

අද දවසේ වැඩිවන ආකාරයෙන් සම්බන්ධිත ලෝකය තුළ, මූල්‍ය අපරාධ යනු වර්ධනය වන ගෝලීය ගැටළුවකි. ඔබගේ පාරිභෝගිකයන් සියලු දෙනා පිළිබඳ නිවැරදි තොරතුරු සතු වීම, වංචනික ගනුදෙනු, මුදල් විශුද්ධිකරණය සහ බදු පැහැර හැරීම හඳුනාගැනීම සහ ඊට බාධා කිරීම සඳහා වන අපගේ හැකියාවේ ප්‍රධාන කොටසකි. ඔබගේ ව්‍යාපාරය පිළිබඳව යාවත්කාලීන වූ තොරතුරු රහිතව, අපට පහත ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය විය හැකිය:

ව්‍යාපාරික ගිණුම

ඔබගේ වත්මන් ව්‍යාපාරික පැතිකඩට ගැළපෙන බවට නොපෙනන ගිණුම් ගනුදෙනු පැහැදිලි කරන ලෙස ඔබෙන් ඉල්ලීම. ඉන්වොයිස් සහ ගිවිසුම් වැනි සහායක ලේඛන මගින් පැහැදිලි කළ නොහැකි විශාල මූල්‍ය හුවමාරු හෝ මුදල් තැන්පතු උදාහරණ වලට ඇතුළත් වේ. ඒවා මුදල් විශුද්ධිකරණය ඇතුළු නුසුදුසු ක්‍රියාකාරකමකට සමාන විය හැකි බැවින් එවැනි මූල්‍ය හුවමාරු අවදානමක් ඉඟි කිරීමට නැඹුරුවක් දක්වයි.

අපි ඔබගේ ව්‍යාපාරය පිළිබඳ යාවත්කාලීන තොරතුරු – උදාහරණ ලෙස, දේශීය සිට අන්තර්ජාතික දක්වා ව්‍යාපාර පුළුල් කිරීම, තබාගන්නේ නම් මෙම ගනුදෙනු පැහැදිලි කළ හැකි අතර අනවශ්‍ය අනතුරු ඇඟවීම් වළක්වනු ලැබේ

ඔබගේ ගිණුමේ අසාමාන්‍ය ක්‍රියාකාරකම පැහැදිලි කළ නොහැකි නම්, අපට විදේශ රටවලට මුදල් යැවීම් වැනි සමහර බැංකු සේවා ප්‍රමාද කිරීමට හෝ සීමා කිරීමට නැතහොත් ඔබ සමග අපගේ බැංකුකරණ සම්බන්ධතාවය අවසන් කිරීමට සිදුවීමට ඉඩ ඇත

පුද්ගලික ගිණුම

සිය ව්‍යාපාරික පොලී වෙතින් සිය පුද්ගලික ගිණුම් වෙත නීත්‍යානුකූල ගෙවීම් ලැබීමේ දී මේවා සුදුසු පරිදි ලේඛනගත කිර ඇතැයි සලකා එම පුද්ගලයා පිළිබඳව කිසිඳු ගැටළුවක් ඇති නොකෙරේ. උදාහරණ ලෙස, අධ්‍යක්ෂකගේ වේතනයෙන් ඇතිවන ගෙවීම්, ගිණුම්ගත කළ අධ්‍යක්ෂකගේ ණය ආපසු ගෙවීම, ලාභාංශ හෝ හිමිකාරීත්ව කොටස් විකිනීම හෝ මිලදී ගැනීම ඔබගේ සමාගමේ වාර්ෂික ගිණුම් සහ/හෝ ලදුපත් මගින් තහවුරු කළ හැකිය

මූල්‍යන අපරාධවලට එරෙහිව අපට එකට එක් වී වැඩ කළ හැකි ආකාරය





ඔබ වැනි ව්‍යවසායකයන් හොං කොං හි ආර්ථිකයේ කොඳු නාරටිය වේ. අපි වංචාවට සහ මූල්‍ය අපරාධයට එරෙහිව ඔබගේ ගිණුම ආරක්ෂා කිරීමට කැපවී සිටින අතර එනිසා ඔබගේ ව්‍යාපාරය ශක්තිමත් විය හැකි අතර, අපි ඔබගෙන් ඉල්ලා සිටින තොරතුරු මෙය ළඟාකර ගැනීමට අපට උපකාර කරනු ඇත.

ඔබ අප සමග ව්‍යාපාරික සහ පුද්ගලික ගිණුම් තබාගන්නේ නම්, අපව දැනුවත් කර සහ යාවත්කාලීනව තැබීම අපට ඔබගේ බැංකුකරණ අවශ්‍යතා සංතෘප්ත කිරීමට සහ මූල්‍ය අපරාධ වලට එරෙහිව අපගේ පාරිභෝගිකයන් සහ පුළුල් ප්‍රජාව ආරක්ෂා කිරීමට උපකාර කරනු ඇත.

ඔබට අපගෙන් ඉල්ලීමක් ලැබුණොත් ඔබ කරන්නේ කුමක් ද?

- අපගෙන් ලැබෙන ලිපි, විද්‍යුත් තැපැල සහ ඇමතුම් පිළිබඳ අවධානයෙන් සිටින්න
- තොරතුරු සඳහා අපගේ ඉල්ලීම් වලට කාලීන ආකාරයකින් ප්‍රතිචාර දක්වන්න
- ඔබ අපට සපයන තොරතුරු සම්පූර්ණ, නිවැරදි සහ යාවත්කාලීන බවට තහවුරු කරගන්න
- ඔබට ව්‍යාපාරික හෝ පුද්ගලික යාවත්කාල පිළිබඳ විමසීම් කිසිවක් තිබේ නම් අප හා සම්බන්ධ වීමට පසුබට නොවන්න



අපි ඔබට ආරක්ෂිත බැංකු පරිසරයක් සපයාදීමට අධිෂ්ඨාන කරගෙන සිටිමු. හොං කොං හි මූල්‍ය පද්ධතියේ අවංකත්වය ආරක්ෂා කිරීමට බැංකු, පුද්ගලයන් සහ ව්‍යාපාර බලගැන්වීමේ අභිලාෂය උදෙසා අපගේ පාරිභෝගිකයන්ගේ තොරතුරු යාවත්කාලීනව තබාගැනීම වැදගත් වේ.

අප හා සම්බන්ධ වන ආකාරය

- ඔබගේ සමාගමේ තොරතුරු යාවත් කිරීමට ඕනෑම HSBC ව්‍යාපාරික මධ්‍යස්ථානයකට පැමිණෙන්න නැතහොත් (852) 2748 8288 (භාෂාව තෝරාගත් පසු #-0 ඔබන්න) වෙතින් අපගේ වානිජ බැංකු සේවා ක්ෂණික ඇමතුම් අංකය අමතන්න
- පුද්ගලික බැංකු කටයුතු සඳහා, හොං කොං හි ඕනෑම HSBC ශාඛාවකට පැමිණෙන්න නැතහොත් (852) 2233 3322 (HSBC ප්‍රමුඛ පාරිභෝගිකයන්), (852) 2748 8333 (HSBC උසස් පාරිභෝගිකයන්) හෝ (852) 2233 3000 (වෙනත් පාරිභෝගිකයන්) අමතන්න

පවත්නා ආරක්ෂාව

HSBC Safeguard යනු අපගේ පාරිභෝගිකයන් වංචාව සහ මූල්‍ය අපරාධයෙන් වඩා හොඳින් ආරක්ෂා කිරීමට අපගේ ගෝලීය පද්ධතිවල ඇති තොරතුරු යාවත්කාලීනව තබාගැනීමට උපකාර කිරීමට නිර්මාණය කර ඇති අපගේ පියවර පරාසයයි. එය දැනට පවත්නා වැඩසටහනක් වන අතර ක්‍රියාවලියේ කොටසක් ඔබගේ විස්තර තහවුරු කිරීමට හෝ යාවත් කිරීමට හෝ නව තොරතුරු සැපයීමට අප ඔබගෙන් ඉල්ලා සිටින නිත්‍ය සමාලෝචන ඇතුළත් වේ. ඔබ හෝ ඔබගේ සංවිධානයේ වෙනස්කම් පිළිබඳව තොරතුරු කිසිවක් වෙනස් වන්නේ නම් ඔබගේ ගිණුම් විස්තර යාවත් කිරීමට ද ඔබට අප හා සම්බන්ධ විය හැකිය. අපි ඔබ වෙනුවෙන් සිදු කරන ගනුදෙනු සැබෑ ඉල්ලීම් පදනම්ව සිදුවන බව තහවුරු කිරීමෙන් මෙය අපට ඔබ සහ ඔබගේ ව්‍යාපාරය ආරක්ෂා කිරීමට උපකාර කරනු ඇත.

ඔබට www.hsbc.com.hk/hsbcsafeguard හි HSBC Safeguard වෙබ් අඩවියේ දී ද තවත් තොරතුරු සොයාගත හැකිය

මෙම ලේඛනය Hongkong and Shanghai Banking Corporation Limited (HSBC) විසින් සපයනු ලැබේ. එය ඕනෑම අධිකරණ බල ප්‍රදේශයක් තුළ සිටින කිසිවකු සඳහා දීමනාවක් හෝ පෙළඹවීමක් ලෙස අදහස් කර නැත. එය මෙම ලේඛනය බෙදාහැරීම සීමා කරන අධිකරණ බල ප්‍රදේශවල සිටින හෝ නේවාසිකව ජීවත්වන කිසිවකු වෙත බෙදාදීම සඳහා අදහස් කර නැත. මෙම ලේඛනයේ අන්තර්ගත තොරතුරු සාමාන්‍ය ස්වභාවයක පමණක් වේ. එය විස්තීරණ වීමක් අපේක්ෂා නොකරන අතර මූල්‍ය, නෛතික, බදු හෝ අනෙකුත් වෘත්තීය උපදෙස් සංස්ථාපනය නොකරයි. සපයා ඇති උදාහරණ සිද්ධියට විශේෂිත වන අතර පුද්ගලයෙකු විසින් සිදුකළ යුතු යම් ක්‍රියා මාර්ගයක් අවස්ථානුකූලව රඳා පවතිනු ඇත. මෙම ලේඛනයේ සඳහන් කිසිඳු උපදෙසක් හෝ ප්‍රකාශයක් මත විශ්වාසය තැබීමෙන් ඇතිවන කිසිඳු පාඩුවකට කිසිඳු තත්වයක් යටතේ HSBC වගකිවයුතු නොවේ. Hongkong and Shanghai Banking Corporation Limited හි පූර්ව ලිඛිත අවසරය නොමැතිව මෙම ප්‍රකාශනයේ කිසිඳු කොටසක් කිසිඳු ආකාරයකින් හෝ කිසිඳු ක්‍රමයකින් ඉලෙක්ට්‍රොනිකව, කාර්මිකව, ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම හෝ වෙනත් ආකරයකින් ප්‍රතිනිෂ්පාදනය, ප්‍රතිසාධන පද්ධතියක ගබඩා කිරීම හෝ සම්ප්‍රේෂණය නොකළ යුතු වේ.